මාවනැල්ල ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය

..................................

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2015 මාර්තු 10 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 14 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 22 දින සභාවේ ලේකම්වරියට යවා ඇත.

1.2 මතය

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලමුද්දර ගාස්තු රැස් කිරීම වෙනුවෙන් ගෙවියයුතු කාර්ය මණ්ඩල දීමනා රු. 65,575 ක් අඩුවෙන් වෙන් කර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයඅවසානයට ප්‍රාදේශීය සභා තැන්පත් ලේඛනය අනුව කර්මාන්ත සඳහා රු. 610,821 ක් ගෙවීමට තිබුණත් ,ප්‍රාදේශීය සභා මුදල් ගිණුමේ රු.576,835 ක මුදල් ශේෂයක් පමණක් ඉතිරිව තිබුණි. මේ අනුව රු. 33,986 ක් සඳහා අවශ්‍ය ගැලපීම් සොයාබලා සිදුකර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ කර්මාන්ත 2 කට ලැබුණු එකතුව රු.19,400 ක මුදල්, ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් යටතේ රු.194,000 ක් ලෙස දැක්වීම නිසා රු.174,600 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේදී විවිධ අරමුදල් යටතේ ලැබුණු ප්‍රතිපාදන ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණත් ,සමාලෝචිත වර්ෂය අවසාන දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු හා අරමුදල් වලින් ලැබිය යුතු රු. 60,223,668 ක මුදලක් ණය හිමියන් හා ණයගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේදී පරිසර අධිකාරි ගිණුමෙන් සේවක ණය ගිණුමට මාරුකර තිබූ රු.474,806 ක මුදල නැවතසේවක ණය ගිණුමෙන් ලබා ගැනීමේදී පරිසර අධිකාරි ගිණුමට බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන හා පලාත් සභා අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණු රු.3,480,000 ක් වටිනා ට්‍රැක්ටරය හා ට්‍රේලරය ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී පොදු තැන්පත් ගිණුම මාර්ගයෙන් මිලදී ගනු ලැබූ රු.60,000 ක පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හදිසි ආපදා කළමනාකරණ ඒකකයෙන් ලැබුණු දම්වැල් කියතෙහි වටිනාකම ගණනයකර ගිණුම්ගතකර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රු.628,857 ක් වටිනා ගැල්වනයිස් කොඩි කණු 568 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.
-----------------------------

ගිණුම් විෂයන් 04 කට අදාලව මුලා ප්‍රකාශන අනුව ශේෂයරු.27,377,614ක් වූ අතර උප ලේඛන අනුව ශේෂය රු.27,552,369 ක් වූයෙන් නොසැසඳුනු වෙනස රු.174,755 ක් විය.

1.3.3 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්.

සමාලෝචිත වර්ෂය අවසානයට 1999 සිට අයවිය යුතුව තිබූ රු.6,818,750 ක ශේෂයක් සහ 1980 සිට ගෙවිය යුතුව තිබූ රු. 20,511,417 ක ශේෂයක් පැවතුණි.

1.3.4 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.570 (ඇ) | 2007 වර්ෂයේ සිට 2012 දක්වා තැන්පත් කරන ලද එකතුව රු. 269,989 ක් වූ කර්මාන්ත තැන්පත් සහ 2014 දෙසැම්බර් 31 දිනට වසර 03 ඉක්මවූ එකතුව රු.561,078 ක්වූ මිශ්‍ර තැන්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ.105 (ඇ) | බැහැරට නිකුත් කළ රු.26,337 ක් වටිනා පුස්තකාල පොත් 169 ක් දීර්ඝ කාලයක සිට ආපසු භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ). සබරගමුව පළාතේ පළාත් සභාවේ මුල්‍ය රීති සංග්‍රහය | |
| 261.2.2 රීතිය | නිලධාරීන් දෙදෙනෙකුට ලබාදුන් එකතුව රු.46,942 ක අත්තිකාරම් මුදල් අවු.01 මාස 10 ක් ගතවී තිබුණද පියවා නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 2012 මැයි 29 දිනැති අංක 3/2012 දරන චක්‍රලේඛය | 2012, 2013 සහ 2014 යන වර්ෂයන්හිදී සභාපති ඇතුළු මන්ත්‍රීවරුන්ට ඉන්ධන අත්තිකාරම් වශයෙන් ලබාදී තිබූ එකතුව රු.2,205,000 ක ඉන්ධන දීමනා සභාවට අදාල රාජකාරි කටයුත්තක් සඳහාම යෙදවූ බවට තහවුරු කර නොතිබූ අතර, අත්තිකාරම් මුදල් පියවීමටද කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,521,628 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,881,817ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.360,189 ක පිරිහීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු.360,189 ක පිරිහීමකට ආදායම් විෂයයන් 02 ක අඩුවීම හා වියදම් විෂයයන් 06 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම ,තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2014.12.31 දිනට හිගය

| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2014 වර්ෂ යේ බිල් කිරීම් | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.01.01 දිනට පැවති හිගයෙන් අයවීම | වර්ෂයේ බිල් කිරීම් වලින් හිහය | මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| iවරිපනම් හා බදු | 15,715 | 7,468 | 11,773 | 4,723 | 8,247 | 7,050 | 15,297 |
| ii බදු කුලී | 1,850 | 52 | 18,634 | 18,517 | 1,798 | 117 | 1,915 |
| iiබලපත්‍ර ගාස්තු | 156 | 25 | 1,086 | 1,075 | 131 | 11 | 142 |
| Ivවෙනත් ආදායම් | 54,087 | 51,033 | 54,921 | 31,401 | 3,054 | 23,519 | 26,573 |

2.3.2 සම්ප්‍රේෂණ කුළුණු ආදායම්

------------------------------

සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 09 ක් හා එම කුළුණු වල සවිකර තිබූ වෙනත් සම්ප්‍රේෂණ 10 ක් සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් නොකිරීම නිසා රු.446,000 ක්ද , අනුකූලතා සහතික නිකුත් නොකිරීම නිසා රු.42,000 ක්ද, ව්‍යාපාර බදු අයකර නොගැනීම නිසා රු.30,000 ක්ද, වශයෙන් එකතුව රු.518,000 ක ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 බදු කුලී

----------

පොදු වෙළඳ පල මස්කඩ, මාළු කඩ බදු දීමේදී මාසිකව අදාල බදු මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් 2002,2003,2005 වර්ෂයන්ට අදාලව එකතුව රු.452,875 ක ආදායමක් අහිමි වී තිබුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු

---------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආයතන වාර්ෂිකව සමීක්ෂණය කර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී 2002,2003 හා 2004 වර්ෂ වලදී ස්ථාන 238 කින් රු.

127,950 ක් ද 2013 වර්ෂයේදී ස්ථාන 09 කින් රු.13,750 ක් ද 2014 වර්ෂයේදී ස්ථාන 87 කින් රු.62,100 ක් ද වශයෙන් එකතුව රු.203,800 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන වල හිග බලපත්‍ර ගාස්තු අයකර ගැනීමටත් ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගැනීමටත් කටයුතු කරන ලෙස ආදායම් පරීක්ෂකවරුන් දෙදෙනාට නියෝග දී තිබුණත් ,2015 අප්‍රේල් 06 දින වන විටත් එම නියෝගය අනුව කටයුතු කර නොතිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු. 1,715,250ක් හා මුද්දර ගාස්තු රු.16,789,058 ක් ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ අවස්ථා තුනකදී ලැබුණු රු. 3,000,000 ක ආධාර මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට වියදම රු. 651,448 ක් එනම් 21.72 % ක් හා 2015 මාර්තු 27 විගණන දිනය වන විට මුළු වියදම රු.1,019,068 ක් එනම් 33.97 % පමණක් විය.

(ආ) නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකරමින් පවතින කාලයේදී බදු ගිවිසුමක් මත කුලියට ලබාගත් තාවකාලික ගොඩනැගිල්ලේ වීදුරු කුටි ඉදිකිරීම සඳහා රු. 116,400 ක් වියදම් කර ප්‍රාග්ධනිත කර තිබුණි. එහෙත් ඉදිකරන ලද නව ගොඩනැගිල්ලෙහි 2011 වර්ෂයේදී කාර්යාලය විවෘත කර තිබුණ ද බදුකුලී මත ලබාගත් ගොඩනැගිල්ලෙහි කරන ලද ඉදිකිරීම 2015 මාර්තු 30 විගණන දිනය වන විටත් ඉවත්කර ගෙන නොතිබුණි.

(ඈ) 2012 මාර්තු මාසයේ සබරගමුව ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලැබුණු රු. 1,425,000 ක් වටිනා ට්‍රැක්ටරය හා ට්‍රේලරය , රු.2,900,000 ක් වටිනා ගලි බවුසරය සහිත ට්‍රැක්ටරය සහ 2014 දෙසැම්බර් මාසයේ ලැබී තිබුණු රු. 1,876,000 ක් වටිනා ට්‍රැක්ටරය හා ට්‍රේලරය ප්‍රාදේශීය සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) හෙම්මාතගම වෙළඳ සංකීර්ණයේ පළමු මහළ හා දෙවැනි මහළ වෙනුවෙන් එක්වත් මුදල් ලබාගත් පුද්ගලයන්ට එම මහල් දෙකෙහි ඉදිකිරීම් අවසන්කර භාර නොදීම නිසා පළමු මහළ කඩකාමර 5කින් රු.1,356,524 ක් ද දෙවැනි මහළ කඩකාමර 2 කින් රු.251,250 ක් ද වශයෙන් රු. 1,607,774 ක් 2002 වර්ෂයේ සිට අයකර ගැනීමට නොහැකිව තිබුණි.

(ඉ) සභා බල ප්‍රදේශයේ කරනු ලබන ඉදිකිරීම් සම්බන්ධයෙන් ගොඩනැගිලි සැළසුම්, පිඹුරුපත් අනුමත කිරීම හා සංවර්ධන බලපත්‍ර ලබාදීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය , පරිසර අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, ප්‍රාදේශීය සභාව යන රාජ්‍ය ආයතන නියෝජනය කරන නිලධාරියෙකු බැගින් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් අනුමත කළයුතු වුවත් 2013 හා2014 වර්ෂයන්හි දින පහක දී සභාපතිවරයාගේ අභිමතය පරිදි පිඹුරුපත් අනුමත කිරීම, ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම කර තිබුණි.

(ඊ) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් 2014 නෙවැම්බර් 17 දින ලැබුණු රු.628,857 ක් වටිනා ගැල්වනයිස් කොඩි කණු 568 න් 2015 මාර්තු 24 විගණන දිනය වන විට කොඩි කණු 206 ක් කාර්යාල පරිශ්‍රයේ ද, කොඩි කණු 128 ක් බාහිර පුද්ගලයින්ට ද නිකුත් කර තිබුණද තොග පොත් වලට ඇතුළත් කර නොතිබුණි.ඉතිරි කොඩි කණු 234 අස්ථාන ගතවී තිබුණි.

(උ) බාහිර ආයතන වෙතින් සභාව වෙත ලැබී තිබූ රු.12,794,997 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 04 ක් වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.
--------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වසර 02 ක කාලයක් ඉක්මවා අක්‍රීයව පැවති බැංකු ගිණුම් 02 ක අගය රු.15,693 ක් විය .

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ හා කරත්ත යටතේ පෙන්නුම්කරන රු. 625,000 ක් වටිනා අංක 53-5643 දරන කැබ් රථය , අනතුරකට ලක්වීමෙන් පසු 2009 වර්ෂයේ සිට ස්වභාවික උපද්‍රව වලට ලක්වෙමින් මාවනැල්ල ළමා උද්‍යානය අසල ගාල්කර තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ යටතේ පෙන්නුම්කරන රු.70,000 ක් වටිනා තාර බොයිලේරුව හා රු.485,000 ක් වටිනා වයිබ්‍රේටින් රෝල ප්‍රයෝජනයට ගැනීමකින් තොරව කොම්පෝස්ට් ව්‍යාපෘති අංගනයේ ස්වභාවික උපද්‍රව වලට ලක්වෙමින් තබා තිබුණි.

3.3 පාරිසරික ගැටළු

------------------

ගලි බවුසරයෙන් රැගෙන එන මළ ද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීමට සෞඛ්‍ය ආරක්ෂිත වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය.

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛණයෙන් වෙන්කර තිබුණු වැඩ විෂයන් 05 ක එකතුව රු. 12,524,000 ක ප්‍රතිපාදන 100% ක්ද, වැඩ විෂයයන් 13 ක එකතුව රු.8,783,970 ක ප්‍රතිපාදන වලින් 52% ත් 99% ත් අතර ද වශයෙන් එකතුව රු.21,307,970 ක් සභා කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) වැඩ විෂයයන් 2 ක අනුමත ඇස්තමේන්තු ඉක්මවා රු.408,980 ක් වියදම් කර තිබුණි.

(ඇ) ආදායම් ශීර්ෂ 2 ක එකතුව රු.12,100,000 ක ඇස්තමේන්තුගත ආදායම උපයා නොතිබුණි.

(ඈ) ඉහත කරුණු අනුව අයවැය ලේඛනය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයන් වශයෙන් යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය වේ.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). අභ්‍යන්තර පාලනය

(ආ). අයවැය පාලනය

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය